# අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ස්තූපයන් පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් (දීඝවාපිය හා නීලගිරිය ස්තූප ඇසුරිණි)

රූපිකා ගමගේ [1]
ජනක පුෂ්ප කුමාර[2]

**හැඳින්වීම**

මිනිසාගේ යට ගියාව පිළිබඳ දැනුම අතීතයට අයත් ද්‍රව්‍යමය සාධක ඇසුරින් ගොඩනගන විද්‍යාව වූ පුරාවිද්‍යාවට වාස්තුවිද්‍යාව මගින් සිදුවන්නේ අමිල මෙහෙයකි. තැනින් තැන ඇවිදිමින් දඩයම්කරුවෙකු හා රැස්කරන්නෙකු වශයෙන් ගත කළ ජීවන ශෛලිය අතහැර දමා තැන්පත් කෘෂිකාර්මික රටාවකට මාරු වූ යුගයේ සිට මිනිසා කරමින් සිටින ප්‍රධාන කටයුත්තක් වනුයේ අවකාශය අවුරා විවිධ ඉදිකිරීම් ඇති කිරීමයි. වාසස්ථාන ලබාගැනීම යන මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමේ සිට අතිමහත් සංකීර්ණ වූ සංස්කෘතික, ආධ්‍යාත්මික වුවමනාවන් ඉටුකර ගැනීම සඳහා මිනිසා අවකාශය අවුරා ඉදිකිරීම් කරයි.

ස්තූපය යන්න සිංහල බසින් හැඳින්වෙන්නේ තුබ හෝ තුඹ යනුවෙනි. එය සිංහලයට වඩාත් හුරුව ඇත්තේ දාගැබ නමින්ය. එහි අරුත ධාතු ගර්භය යන්නය. ස්තූප යන වචනය සංස්කෘත එකකි. පාලි භාෂාවෙන් ථූප නමින් හැඳින්වෙයි. අද අප සෑය, චෛත්‍යය යන නම්වලින් හඳුන්වන්නේද මෙම දාගැබයි. ප්‍රාග් යුගයේදී පුද පූජා ලැබූ වෘක්ෂයන්ද චෛත්‍යය යනුවෙන් හඳුන්වා ඇත.

ස්තූප අනෙක් කවර රටකටත් වඩා වැඩි වශයෙන් මුල්බැස ගත්තේ ශ්‍රී ලංකාවේය. ඇතැම් උගතුන් ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියේ එක් හැඩගැස්වීමක් තේරුම් කර දෙන්නේද ස්තූප යොදා ගැනීමෙනි. ''ගමයි-වැවයි-දාගැබයි'' යන සුලභ යෙදුමෙන් කියැවෙන්නේ එයයි.

රෝහණ රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකුණු දිගාමඬුලු පුරවරයේ අම්පාර දිස්ත්‍රික්කයේ ඉතිහාසය බුද්ධ කාලය දක්වාම ඈතට යන බවට ඓතිහාසික සාධක ලැබෙයි. ප්‍රදේශය පුරා රජරටට නොදෙවෙනි ලෙස ස්තූප නිර්මාණය කරතිබූ බවට සාක්ෂ්‍ය මෙම ප්‍රදේශයෙන් හමුවේ. ඒවා දීර්ඝ කාලයක් තිසිසේ වූ සංවර්ධන ක්‍රියාදාමයක ඵලයක් වේ. අනුරාධපුරයට සාපේක්ෂව දියුණු ස්තූප තාක්ෂණයක් පැවතිය ද ඒ පිළිබඳව පර්යේෂකයන්ගේ අවධානය යොමු වී නැත. එබැවින් ඒ පිළිබඳ මූලාශ්‍ර සාධකද අල්ප වේ. අප පර්යේෂණය තුළින් අපේක්ෂා කරන්නේ රෝහණයේ අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසිකත්වය මැනීම සඳහා ප්‍රධාන ස්තූපවලින් ලැබෙන දායකත්වය පිළිබඳ සොයා බැලීමකි.

---

1 සහාය කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්ව විද්‍යාලය.
2 මධ්‍යම සංස්කෘතික අරමුදල.

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යනය කිරීමේදී ප්‍රාදේශීය රාජ්‍ය පිළිබඳව පවතින්නේ අඩු අවධානයක් වීමද, පවත්නා ඓතිහාසික කරුණු ප්‍රමාණවත් නොමැති වීමද සැලකිය යුතු මට්ටමේ අඩුපාඩුවකි. එම නිසා ජාතික ඉතිහාසයට ප්‍රාදේශීය ඉතිහාසය එක් කිරීමේ සංකල්පයට අදාළව මෙම අධ්‍යනය සිදු කරනු ලබන අතර එහිදී රෝහණ දේශයේ ප්‍රධාන පුරාවිද්‍යාත්මක උරුමයන් රැදි පුරවරයක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ස්තූප පිළිබඳව අවධානය යොමු කර ඇත.

**අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ප්‍රධාන චෛත්‍යය හරහා රෝහණයේ ප්‍රාදේශීය ඉතිහාසය ගොඩනගන්නේ කෙසේද ?**

යන මෙම ප්‍රධාන අධ්‍යන ගැටලුව විසදීම සඳහා ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවේ. ඒ අනුව මූලික වශයෙන් අදාළ ස්තූප සහ ඓතිහාසිකත්වය හා ඒ පිළිබඳ මූලාශ්‍රගත තොරතුරු විමර්ශනය කිරීම වැදගත් වේ. එහිදී මෙම ප්‍රදේශයේ ස්තූප ඉදිකිරීමේ කාල වකවානු, ස්තූප තාක්‍ෂණය, ව්‍යාප්තව ඇති ප්‍රදේශ ආදී කරුණු පිළිබඳව අපගේ අවධානය යොමු කිරීම වැදගත් වේ.

**අධ්‍යන අරමුණු**

ප්‍රධාන රාජධානියෙන් පරිබාහිර ප්‍රදේශයක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ ස්තූප කර්මාන්තය පිළිබඳ අවබෝධ කර ගැනීම පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ වී ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ ස්තූප පිළිබඳව සිදුකරන ලද ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යනයේදී එම ප්‍රදේශයේ ඇති ප්‍රධාන ස්තූපයන්හි ඇති වටිනාකම හඳුනා ගැනීම වැදගත් වේ. මෙම ස්තූපවල වටිනාකම තීව්‍ර කරවන පෞරාණික උරුමයන් තව දුරටත් ආරක්‍ෂා වී තිබෙන්නේද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය. ඒ අනුව මෙම ප්‍රදේශයෙහි ප්‍රධාන ස්තූප වන නීලගිරිය හා දීඝවාපිය චෛත්‍යය වලට අදාළ පුරාවිද්‍යාත්මක වටිනාකම හා ඒ ආශ්‍රිත ස්මාරකයන් පිළිබඳව විමසීමට ලක් කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා දත්ත හා තොරතුරු රැස් කිරීමේදී මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යනය යන මූලාශ්‍ර දෙවර්ගය කෙරෙහි අවධානය යොමු කරන ලදී. මූලාශ්‍ර පරිශීලනය යනු මෙම පර්යේෂණ පත්‍රිකාව සම්බන්ධව සිදුකරන පුස්තකාල සමීක්‍ෂණ ක්‍රමවේදයයි. ප්‍රකාශිත මූලාශ්‍ර මඟින් ලබා ගන්නා ලද සිතියම් Gis හා Photo Shop මෘදුකාංග ඔස්සේ වැඩි දියුණු කර ගැනීම තුළින් පර්යේෂණ පත්‍රිකාව සඳහා සිතියම්කරණය උපයෝගී කරගන්නා ලදී. තවදුරටත් ගුණාත්මක ලෙස ඉදිරිපත් කිරීමේදී ක්ෂේත්‍රයට ගොස් ලබා ගත් දත්ත උපයෝගී කරගනිමින්

පරිමාණයට මෙන්ම පරිමාණයට නොවන ලෙස සැලසුම්කරණය යොදා ගන්නා ලදී.

පර්යේෂණය සඳහා දත්ත රැස් කර ගැනීමේදී භාවිත කළ අනෙක් ප්‍රධාන අංගය වන්නේ ක්ෂේත්‍ර අධ්‍යනයයි. එහිදී ක්ෂේත්‍ර ඇවිදීම (filed walking) මූලික විය. අවසාන අර්ථ නිරූපන හා විග්‍රහයට මෙම සියලු ම භූමිය පරීක්ෂා කළ යුතු වුව ද අධික වනගහනයත්, ඇතැම් ස්ථානවලට යෑමට අඩිපාරක් හෝ ඒ ස්ථාන වලට ළගා වීමට ඉදිරිපත්වන හෝ ඒ පිළිබඳ දන්නා කිසිවෙකු නොවීම යම් තරමක බාධාවක් වූයෙන් " ක්ෂේත්‍ර ඇවිදීමෙන් " ද ළගා වීමට නොහැකි ස්ථාන අම්පාර දිස්ත්‍රික්කය තුළ විය. එබැවින් ළගා වීමට හැකියාව තිබූ සියලුම ස්ථානවලින් අවශ්‍ය දත්ත හැකි උපරිමයෙන් ලබා ගැනිණ.

**භූගෝලීය පිහිටීම හා ඓතිහාසික පසුබිම**

අම්පාර දිස්ත්‍රික්කය හෙවත් පුරාතන දිගාමඩුලු ජනපදය වර්තමාන පරිපාලන බෙදීම් අනුව නැගෙනහිර පළාතට අයත්වේ. මඩකළපුව, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කයට මායිම්ව පිහිටි මෙම දිස්ත්‍රික්කයේ එක් කොටසක සීමාව වූයේ ඉන්දියන් සාගරයයි. මෙම දිස්ත්‍රික්කය වර්තමානය වන විට 4431.4 $km^2$ වපසරියකින් යුක්ත වේ.

අනුරාධපුර යුගයේ සද්ධාතිස්ස රජු යටතේ පාලනය වූ මේ ප්‍රදේශය පොළොන්නරු අවධිය වන විට යුධ පිටියක් වශයෙන් භාවිත කර ඇත. රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමත් සමඟ දීඝවාපී ප්‍රදේශය ජනතාවගෙන් ගිලිහෙන ලදී. 1815 දී බ්‍රිතාන්‍යය ජාතිකයන්ට ලංකාව නතු වීමත් සමඟ මේ පෙදෙසෙ හි පුදබිම් විනාශයට ලක් විය. 1818 ඇති වූ කැරැල්ල ලාංකිකයන්ට ඉතාමත් තීරණාත්මක සටනක් වූ අතර එහිදී යටත් විජිත ජාතීන්ගෙන් නිදහස දිනා ගැනීම සඳහා දිවි පරදුවට තබා කටයුතු කර ඇත්තේ අම්පාර පෙදෙසට අයත් ප්‍රදේශවල ජනතාව ය. දිගාමඬුලු ජනපදයේ අතීත තතු මෙසේ පැවතිය දී ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන පුරාවිද්‍යාත්මක ස්මාරක රැසකින් ගහණ පෙදෙසකට ද අම්පාර දිස්ත්‍රික්කය උරුමකම් කියා ඇත.

**දීඝවාපී චෛත්‍යය**

දීඝවාපි පුජා භූමිය ඓතිහාසික වශයෙන් වටිනාකමක් ඇති බැතිමතුන්ගේ වන්දනාවට පාත්‍ර වන විහාරාංගය වන්නේ චෛත්‍යය රාජයාය. එම චෛත්‍යය ඉදිකිරීමේ පටන් යුගයන් කිහිපයකදී රජවරුන් කිහිපදෙනෙකුගේ ප්‍රතිසංස්කරණයන්ට භාජනය වී වර්තමානය වන විට දක්නට ලැබේ. අතීතයේදී ඉදිකරන විට තිබූ තත්වයට වඩා යම් කිසි වෙනසකට භාජනය වූ බව පැහැදිළිව දිස්වුවද රජය හා දායකයින්ගේ මැදිහත් වීම නිසා තව දුරටත් ජනතාවට වැද පුදා ගැනීම සඳහා සංරක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී. දීඝවාපී චෛත්‍යය තහවුරු

කිරීමේ පරමාර්ථය ඉෂ්ට කර ගැනීම සඳහා කැණීම් කටයුතු සිදු කරන ලදී. ඒ අනුව සිදු කරන ලද කැණීම් මත පිහිටා චෛත්‍යය මෙන්ම එහි අංගයන් පිළිබඳව කරුණු අනාවරණය කරමින් කැණීම් මගින් හෙළිවූ කරුණු අධ්‍යයනය කිරීම වැදගත් වේ.

- දීඝවාපි චෛත්‍යය
- පේසා වළලු සහ මළුව
- වාහල්කඩ
- පුරාවස්තු
- ප්‍රතිමා ගෘහය පිවිසුම් දොරටු

වශයෙන් පෙන්වා දීමට පුළුවන. දීඝවාපි චෛත්‍යය හා ඒ ආශ්‍රිතව පැවති පුරාවිද්‍යාත්මක වටිනාකම මෙමගින් සපථ කර ගත හැකිය.
දීඝවාපි චෛත්‍යය පිළිබඳව සිදු කරන ලද ගවේෂණයන් සාකච්ඡා කිරීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එම ස්මාරකය කෙරේ දැඩි අවධානයක් යොමු කළ බව පෙනෙයි. දීඝවාපි චෛත්‍යයේ උපරිභාගය අද දක්නට නොලැබේ. එහි උස නිශ්චිත ලෙස මීටර් 112 යැයි උපකල්පනය කළ හැකි නමුදු ඒ සඳහා වුවද පැහැදිලි භෞතිකමය සාධක ශේෂව තිබෙන්නේ ඉතාම අල්ප වශයෙනි. වංශකතාවලට අනුව දීඝවාපි චෛත්‍යය ගොඩනැගූ කාලය සැළකිල්ලට ගෙන බලන කළ ඡත්‍රයකින් හෝ යූපයකින් උපරිභාගය සංයුක්ත වන්නට ඇත. දීඝවාපි චෛත්‍යය වටා එහි තිබුණේයැ යි සැළකිය හැකි ඡත්‍රයක කොටස් අනාවරණය වී ඇත.

## නීලගිරි චෛත්‍යය

චෛත්‍යය පිළිබඳව සිදුකරන ලද ගවේෂණයන් සාකච්ඡා කිරීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එම ස්මාරකය කෙරේ දැඩි අවධානයක් යොමු කළ බව පෙනෙයි. මෙම දාගැබේ උපරිභාගය අද දක්නට නොමැත. ගරා වැටුනු ස්තූපයේ මුළු උස ප්‍රමාණය අඩි 72 ලෙස ගණනය කර ඇත. ස්තූපයේ වට ප්‍රමාණය අඩි 642 ක් ලෙස මූලික වාර්තා වලට අනුව පෙන්වාදිය හැකිය.
චෛත්‍යයේ ගර්භයෙන් ඉහළ කොටස් පහතට ගරා වැටී ගර්භයට හානි සිදු වී තිබෙන ආකාරයක් පෙනෙන්නට ඇත. 1970 දශකයේදී මේ ස්තූපය සංරක්ෂණය කර ඇති අතර එය නැගෙනහිර කොටසට පමණක් සීමා වී ඇති බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. එයට හේතුව ලෙස ඔවුන් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මුල් වූ බව ප්‍රකාශ කරයි. 2011 වර්ෂයේදී නැවත මූලික වරට කැණීම් කටයුතු ආරම්භ කර ඇති අතර 1970 දශකයේදී සිදු කරන ලද සංරක්ෂණ කොටස එහිදී පැහැදිළිව හඳුනා ගැනීමට හැකි වී ඇත. නීලගිරි චෛත්‍යය ගොඩ නැගූ කාලය සැළකිල්ලට ගත් විට එය ඡත්‍රයකින් හා යූපයකින් උපරිභාගය සංයුක්ත වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. නීලගිරි චෛත්‍යය වටා එහි තිබුණේ යැයි කිව හැකි ඡත්‍රයක කොටස් අනාවරණය වී ඇත. මෙම ඡත්‍රයේ විශ්කම්භය සෙන්ටිමීටර් 146 වන අතර

එහි මධ්‍යයේ ඇති සිදුරෙහි විෂ්කම්භය සෙන්ටිමීටර් 15 වන අතර එහි ගැඹුර සෙන්ටිමීටර් 6.2 කි. ඡත්‍රයෙහි 4/3 පමණ කොටසක් ඉතිරි වී ඇත.චෛත්‍යයට අයත් වන යූප ගලක් ගර්භය මුදුනේ ගලවා වැටී ඇති අයුරුද හඳුනා ගත හැකිය. ගලින් නිමවා ඇති එහි මුල් කොටසෙහි වට ප්‍රමාණය සෙන්ටිමීටර් 183 වන අතර අග කොටසෙහි වට ප්‍රමාණය සෙන්ටිමීටර් 148 වේ.

මෙම සාධක අනුව පැහැදිළි වන්නේ නීලගිරි ස්තූපයේ උපරිභාගය යූපස්ථම්භයකින් හා ඡත්‍ර සහිත දාගැබක් වූ බවයි. කුඩිම්බිගල ආරණ්‍යය සේනාසනය අසළ ඇති සංරක්‍ෂණ ස්තූපයද ඡත්‍ර සහිත ස්තූපයක් වන අතර පුරාවිද්‍යාඥයින්ගේ මතයන් හා වංශ කතා පරිශීලනය කිරීමේදී දීඝවාපී චෛත්‍යයද ගොඩ නැගූ කාලය සැළකිල්ලට ගත් විට ඡත්‍රයකින් හෝ යූපයකින් උපරිභාගය සංයුක්ත වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. මේ අනුව පැහැදිළි වන්නේ නැගෙනහිර පළාතේ පැවති ස්තූප බොහෝමයක උපරිභාගය ඡත්‍රයකින් හෝ යූප ගලකින් සමන්විත වූ බවයි.

**සමාලෝචනය**

අම්පාර දිස්ත්‍රික්කයේ විශාලතම චෛත්‍යයන් වන්නේ **දීඝවාපිය** හා **නීලගිරිය** ස්තූපයන් ය. චෛත්‍යයන් දෙකෙහිම උපරිභාගය දක්නට නොමැති අතර ඡත්‍රයකින් හෝ යූපස්ථම්භයකින් එය ඉදිකර තිබූ බවට සැලකේ. පේසා වළලු ත්‍රිත්වයකින් සහ ගර්භයකින් යුක්තව වර්තමානයෙහි මේ ස්තූපයන් දක්නට ලැබේ. කාලානුරූපව රාජ පරම්පරාවල අනුග්‍රහය මත ස්තූපයන්හි විශාල කිරීම් හා නව අංග එකතු කිරීම් දක්නට ලැබේ. ස්තූපාංග කිහිපයකින් යුක්තව නිර්මාණය කර ඇති එම අංග නිර්මාණය කිරීමේදී එකිනෙකට වෙනස් තාක්‍ෂණික ක්‍රම භාවිත කර ඇති බවට සනාථ විය. මේ ථූපයන් අරමුණු කිහිපයක් මත නිර්මාණය වී ඇති අතර නීලගිරිය ස්තූපය මේ වන විටත් කැණීම් මට්ටමේ පවතින අතර සංරක්‍ෂණය කිරීමෙන් අනතුරුව දීඝවාපී චෛත්‍යය මෙන්ම බැතිමතුන්ගේ වන්දනයට පාත්‍ර කිරීමට නියමිතය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ථූපවංශය,* (1986). :සංස්.).රංජිත් වනරත්න. කොළඹ: සමයවර්ධන පොත් ප්‍රකාශකයෝ.

*සිංහල ථූප වංශය* (1989). ඩබ්ලිව්. ඇස්. කරුණාතිලක කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*මහාවංස ප්‍රථම භාගය* (1996)). පරිවර්තනය. එච්. සිරි සුමංගල. කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

උඩවත්ත, පියදාස. (2008). *දිගාමඬුල්ලේ සංචාරයක්.* කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳ ගමගේ, පියසේන. (2000). *දිගාමඬුලු දනව්ව.* කොළඹ 10 : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.